# සති පාසල

## ලාභ අරමුණු කර නොගත් සංවිධාන

**01) ගැළපෙන පිළිතුර යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න**

1) ලාභය අරමුණු කර නොගත් සාමාජික සුභසාධනය හා සමාජ සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ……………………………………….. සංවිධාන ලෙස හඳුන්වයි

2) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල කිසියම් කාලපරිච්ඡේදයක් තුළ සිදුවන සියලුම මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරනු ලබන ගිණුම ………………………………………….. වේ

3) ලැබීම් හා ගෙවීම් ……………………………….. සමාන ගිණුමකි

4) කාලපරිච්ඡේදය තුළ මුදල් ලැබීම් හා ගෙවීම් වල …………………….. කාලපරිච්ඡේදය අවසාන මුදල් ශේෂය වේ

5) ලැබීම් හා ගෙවීම් ගිණුම ……………………….. පදනම අනුව සකස් කරයි

6) මුදල් යනු වත්කමකි මුදල් ලැබීම නිසා වත්කම් වැඩි වන බැවින් සෑම මුදල් ලැබීමක් ම මෙම ගිණුමේ **……………………..** සටහන් කරයි

7) ……………………………………….. පදනම මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මුදලින් ලැබුණද නොලැබුණ ද මුදලින් ගෙව්වද නොගෙව්වද කාලච්ඡේදයට අයත් සියලුම ආදායම් හා වියදම් සටහන් කරයි

8) ලාභ අරමුණු කර නොගත් සංවිධාන විසින් කිසියම් නිශ්චිත කාලච්ඡේදයක් තුළ සිදුකරන ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා පිළියෙල කරන ප්‍රකාශය …………………………………………… යි

9) …………………………………… ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බොහෝ දුරට සමානය

10) ආදායම් ප්‍රකාශය තුලින් කාලච්ඡේදය අවසානයේ …………………………………….. ගණනය කරයි

11)…………………… වියදම් ආදායම් ප්‍රකාශයට ඇතුලත් නොකරයි. ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරන්නේ …………………………… වියදම් පමණි.

12) ක්ෂය වීම් හා ලැබිය යුතු හා ගෙවිය යුතු වියදම් ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් ……………………………………………..

**පිළිතුරු සපයන්න**

13) ලැබීම් ගෙවීම් ගිණුමේ හා ආදායම් ප්‍රකාශයේ වෙනස වගු ගත කරන්න

14) යාවජීව සමාජිකත්වය යනු කුමද්ද

15) මුදල් පදනම හා උපචිත පදනම අතර වෙනස දක්වන්න

02) ශක්ති යොවුන් සාමාජයේ 2020/12/31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ලැබීම් ගෙවීම් පහත පරිදි වේ

2020/01/01 මුදල් ශේෂය රු 12000

| | |
|---|---|
| සාමාජික මුදල් ලැබීම | 200000 |
| පරිත්‍යාග කිරීම් | 10000 |
| සංග්‍රහ වියදම් | 5000 |
| පත්තර විකිනීම | 40000 |
| ගොඩනැගිලි කුලි | 10000 |
| ප්‍රවාහන වියදම | 7000 |
| දුරකථන | 5000 |
| ටිකට්පත් විකිණීම | 10000 |
| ලී බඩු මිලට ගැනීම | 20000 |
| පරිත්‍යාග ලැබීම් | 50000 |
| විදුලි ගාස්තුව | 15000 |
| මුද්‍රණ වියදම | 25000 |
| පොලී ආදායම් | 15000 |
| ලිපි ද්‍රව්‍ය | 15000 |

යොවුන් සමාජයේ සමාජික සංඛ්‍යාව 500 කි මාසික සාමාජික ගාස්තුව රු 500 කි

අවශ්‍ය වන්නේ

- 2020 වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න
- 2020 වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න

03) දිලෙන තරු යොවුන් සමාජයේ පහත දැක්වෙන මුදල් ලැබීම් හා ගෙවීම් 2020 වර්ෂය තුළ දී සිදු වී ඇත

| | |
|---|---|
| ප්‍රවාහන වියදම | 7000 |
| දුරකථන | 1500 |
| ටිකට්පත් විකිණීම | 20000 |
| සංග්‍රහ වියදම | 2500 |
| උපකරණ මිලට ගැනීම | 70000 |
| පරිත්‍යාග ලැබීම් | 50000 |
| විදුලි ගාස්තුව | 15000 |
| මුද්‍රණ වියදම | 2000 |
| කම්කරු කුලී | 15000 |

අමතර තොරතුරු

1) යොවුන් සමාජයේ සමාජික සංඛ්‍යාව 300 කි ඉන් 28 දෙනෙකු සමාජික මුදල් ගෙවා නැත මාසික සාමාජික ගාස්තුව රු 200 කි

4) ටිකට්පත් විකිණීමෙන් රු 15000 ලැබිය යුතුය

3) දුරකථන ගාස්තු වැඩිපුර රු 500 ගෙවා ඇත

4) උපකරණ 10% කින් වාර්ෂික ක්ෂය කරයි

5) දෙසැම්බර් මස විදුලිය වියදම රු 1500 මෙතෙක් ගෙවා නැත

6) ගෙවිය යුතු කම්කරු කුලි රු 1000

අවශ්‍ය වන්නේ

- 2020 වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම පිළියෙල කරන්න
- 2020 වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම පිළියෙල කරන්න

එල් ආර් පී ගුණරත්න

කෑ/ මාබෝපිටිය මහා විද්‍යාලය